

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# කාර්යය සාධන වාර්තාව 2015



## "ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි"

---


**පළාත් ආදායම්දෙපාර්තමේන්තුව**

දු.ක. 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් :info@revenuedept.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenuedept.cp.gov.lk

# පෙරවදන

## ආයතනයේ නීතිමය තත්වය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන්වන සංශෝධනය මඟින් පළාත් සභාව නම් වූ පරිපාලන ඒකකය ආරම්භ වූ අතර, මෙම පළාත් සභාවන් හී ආදායම් කටයුතු සම්බන්ධ කාර්යභාරයන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 36 වන වගන්තිය යටතේ 36:1 සිට 36:20 දක්වා ඇති උප වගන්ති මගින් පළාත් සභාවන්ට අදාල වූ ආදායම් ප්‍රභවයන් හඳුන්වා දී ඇත.

ඉහත නෛතික විධිවිධානයන්ට අනුකූලව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්මත කර ගන්නට යෙදුණු 1990 අංක 17 දරණ මුදල් ප්‍රඥප්තියේ නෛතික රාමුව තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

ඉහත කී මුදල් ප්‍රඥප්තිය මගින් හා 1996 අංක 03 දරණ මධ්‍යම පළාත් මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනයට යටත්ව බදු හා ගාස්තු මෙන්ම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු බදු හා ගාස්තු වර්ග දක්වමින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හදූන්වා දී ඇත. පහත සඳහන් ආදායම් ශීර්ෂ මෙම ප්‍රඥප්ති මගින් දක්වා ඇත.

- පිරිවැටුම් බද්ද
- මුද්දර ගාස්තුව
- ඔට්ටු බද්ද
- ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද
- මෝටර් ප්‍රවාහන පනත යටතේ ගාස්තු දණ්ඩන හා බලපත්‍ර ගාස්තු
- අධිකරණ දඩ හා ගාස්තු
- මධ්‍යම පළාත් ලොතරැයි පිළිබඳ බදු
- ඉඩම් හා ගොඩනැගිලි බද්ද
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් සඳහා ගාස්තු
- සුරාබදු ආදායම
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු
- පඩි හා මිමි ආඥාපනත යටතේ ගාස්තු
- තෑගි තරඟ බද්ද

විධිමත් නෛතික ආවරණ අවශ්‍යතාවය හා ශ්‍රම බලකායේ සීමිතභාවය යන කාරණා මත පිරිවැටුම් බද්ද, මුද්දර බදු ගාස්තුව, ඔට්ටු බද්ද යන බදු වර්ගයන් කෙරෙහි මූලික අවධානය යොමු කරමින් අප දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වූ අතර, 2011 අය වැය යෝජනා මඟින් පිරිවැටුම් බද්ද අත්හිටුවීම නිසා වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිඟ හිටි බදු පමණක් අයකර ගැනීම සිදුවේ. ඊට අමතරව 2014-04-01 සිට ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද ද, බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 2015 නොවැම්බර් මාසයේ සිට ද ක්‍රියාත්මක වේ.

## කාර්යයන් හා වගකීම්

කාර්යක්ෂම සාමානාත්මක හා යුක්ති සහගත බදු පරිපාලන ක්‍රමයක් ස්ථාපිත කර මධ්‍යම පළාතේ ජනතා අභිවෘද්ධිය සඳහා අවශ්‍ය මූල්‍යමය සම්පත් නියමිත ඉලක්ක අභිබවමින් නීතියට එකඟව බදු හා ගාස්තු වශයෙන් රැස් කිරීම හා ඊට අදාළව විධිමත් ප්‍රතිපත්තියක් කාලීන අවශ්‍යතා මත කාර්යක්ෂමව පවත්වා ගෙන යාම.

## තත්ත්ව විශ්ලේෂණය

පිරිවැටුම් බද්ද අත්හිටුවීමත් සමඟම අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය බවට පත්වන්නේ මුද්දර ගාස්තුයි. ඊට අමතරව ඔට්ටු බද්ද ද, 2014-04-01 සිට බනිජ බද්ද ද අයකිරීම සිදුවේ. තවද, නව ආදායම් ප්‍රභවයක් ලෙස බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 2015 ඔක්තෝබර් මාසයේ දී සම්මත වූ අතර 2015 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක වේ. එමෙන්ම නව ආදායම් ප්‍රභවයක් ලෙස වැඩි ආදායමක් උපයා ගැනීමට අවස්ථාව ඇති මෝටර් රථ පැවරීමේදී අය කළ යුතු මුද්දර ගාස්තු සම්බන්ධයෙන් තීරණය කිරීම සාකච්ඡා මට්ටමේ පවතී. කෙසේ වුවද, මුද්දර ගාස්තු හැරුණු විට අනෙකුත් ප්‍රභවයන්ගේ ආදායම් මට්ටම පහළ අගයක් ගනී.

ආදායම් ඉලක්ක සපුරා ගැනීමට නම් පවතින ආදායම් ප්‍රභවයන්ගේ ආදායම් ලබාගැනීමේ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම හා ඵලදායි මට්ටමකින් පවත්වා ගනිමින් පවතින නීති රාමුව තුළ නව ආදායම් ප්‍රභවයන් සොයා ගැනීමේ අභියෝගය දෙපාර්තමේන්තුව වෙත පවතී. මධ්‍යම රජය මඟින් ක්‍රියාත්මක  බදුවලට අමතරව සභාව මඟින් නව ආදායම් ප්‍රභවයන් අනුමත කර ක්‍රියාත්මක කිරීම අසීරුය. එමෙන්ම,

- ජනප්‍රිය පාසල් සහ යටිතල පහසුකම් පැතිරීමේ ඇති දැඩි විෂමතාවය නිසා පහසුකම් සහිත ප්‍රදේශවලින් දුරස් වන විට දේපලවල මිල ගණන්වල විශාල වෙනසක් තිබීම හා පහසුකම් සහිත ප්‍රදේශවල දේපල සීමිත නිසා හුවමාරු වීම අඩුවෙමින් පැවතීම
- පළාතේ ඉඩම්වලින් බහුතරය කෘෂිකාර්මික හා වතු ඉඩම් සහ රක්ෂිත භූමි වීම නිසා කැබලි කර විකිණීම අඩු වීම
- දේපලවල මිල ඉහළ යාමට තුඩු දෙන මහා පරිමාණ හෝ මධ්‍යම පරිමාණ ව්‍යාපෘති මධ්‍යම පළාත තුළ බහුල නොවීම
- නාගරීකරණය වීමේ අඩු වේගය යන හේතු නිසා දෙපාර්තමේන්තු ප්‍රධානතම ආදායම් මූලාශ්‍රය වන දේපල හුවමාරු අගය මත අය කරන මුද්දර ගාස්තු ආදායම් ඉහළ නංවා ගැනීම අභියෝගයක්ව පවතී.

2012 වර්ෂයේ සිට සිදු වූ බැංකු පොලී අනුපාත අඩුවීමෙන් ජනතාව තුළ ඉඩම් මිලදී ගැනීමේ ප්‍රවණතාව වැඩි වූ අතර, අප දෙපාර්තමේන්තුව මඟින් නිරන්තරව කරගෙන යන පූර්ව දැනුවත් කිරීම් හා පසු විපරම මඟින් වෙළඳපොල වටිනාකම මත සාධන පත්‍ර සැකසීමට සැලැස්වීමෙන් 2014 මෙන්ම 2015 වර්ෂයේ ද ඉලක්ක අභිබවා විශාල ආදායමක් රැස්කර ගැනීමට හැකි විය. නමුත් මෙම අඩු බැංකු පොලී අනුපාත තත්වය රජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා සම්බන්ධ බැවින් දිගුකාලීනව පවතින්නක් ලෙස අපේක්ෂා කළ නොහැකිය. 2015 වර්ෂයේ අග භාගයේ සිට බැංකු පොලී අනුපාත වැඩිවීමේ  ප්‍රවණතාවක් ඇත.

මධ්‍යම පළාත් සභාවේ ඵලදායිතාවය නංවාලීමේ අරමුණින් 2012 වසරේදී සකස් කෙරුණු උපායශීලි සැලසුමට අදාළ පළාතේ එක් දෙපාර්තමේන්තුවක් ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ද ක්‍රියාකාරී දායකත්වය සැපයීමේ අරමුණ පෙරදැරි කරගෙන එම උපායශීලි සැලසුමේම කොටසක් ලෙස අප දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂයට අදාල අරමුණු හා උපායයන් සකස් කෙරින.

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත)

**දැක්ම**

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

**මෙහෙවර**

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත්වාසින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

**වටිනාකම**

1. පරිපූර්ණත්වය
2. වෘත්තීය දක්ෂකම
3. කැපවීම
4. සහයෝගීත්වය

**පරමාර්ථ / අරමුණු**

1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම
2. නව ආදායම් උත්පාදන මූලාශ්‍ර පිළබඳ පර්යේෂණ හා සංවර්ධනය
3. වෘත්තීය නිපුණතාවය වැඩි දියුණු කිරීම
4. යහපාලනය

**ආදායම් ඉලක්කය 2015 වර්ෂය**

| ආදායම් ප්‍රභවය | | ඉලක්කය රුපියල් |
|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 880,000,000 |
| 02 | හිග පිරිවැටුම් බදු | 4,000,000 |
| 03 | ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද | 3,000,000 |
| 04 | ඔට්ටු බද්ද | 300,000 |
| | එකතුව | **887,300,000** |

**2015 වර්ෂයේදී අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය**

| ආදායම් ප්‍රභවය | | ඉලක්කය රුපියල් | තත්‍ය ආදායම රුපියල් | ඉලක්ක අභිබවා රැස් කළ ආදායම | ළඟා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 880,000,000 | 1,342,990,172 | 462,990,172 | **152%** |
| 02 | හිඟ පිරිවැටුම් බදු | 4,000,000 | 6,184,356 | 2,184,356 | **154%** |
| 03 | ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද | 3,000,000 | 3,306,581 | 306,581 | **110%** |
| 04 | ඔට්ටු බද්ද | 300,000 | 153,728 | -146,272 | **51%** |
| 05 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>1. බලපත්‍ර ගාස්තු<br>2. ලියාපදිංචි ගාස්තු<br>3. ඇප තැන්පතු | | <br>650,000<br>75,000<br>*13,000,000 | | |
| | එකතුව (සමස්ථ **ආදායම්** රැස් කිරීම) | **887,300,000** | **1,353,359,837** | **465,334,837** | **152%** |

* **2015** වර්ෂයේ සැළසුම් සකස් කිරීමේදී බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය අනුමත වී නොතිබීම ඒ සඳහා ආදායම් ඉලක්ක ඇතුළත් නොකරන ලදී. තවද, බඩු උකස් ගන්නන් විසින් කරන ලද ඇප තැන්පතු, ආදායමක් ලෙස ගණනය කර නැත.

**1. 2015 වර්ෂයේදී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 880 ක් එකතු කිරීම**

වර්තමානයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය මුද්දර ගාස්තු ආදායම වන බැවින් ඉහත අරමුණ වෙත ලඟා වීමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුල සිටම මනා සැලැස්මක් ඇතිව කටයුතු කල අතර, දෙපාර්තමේන්තුවේ වැඩ බෙදාහැරීමේදී මුද්දර අංශය වෙත වැඩි අවධානයක් යොමු කරන ලදී ඒ අනුව සියළුම තක්සේරුකරුවන් (14 දෙනෙකු), බදු නිලධාරීන් විසිහතර (24) දෙනෙකු සංවර්ධන නිලධාරීන් දොළොස් දෙනෙකු (12) ද එම අංශය වෙත අනුයුක්ත කරන ලදී. ඒ අනුව පෙර වර්ෂයට වඩා රුපියල් **ලක්ෂ 2,705** වර්ධනයක් කරා ළඟා කර ගනිමින් ඉලක්ක කළ මුද්දර ආදායම ඉක්මවා යෑමට දෙපාර්තමේන්තුවට හැකි විය.

2013-01-01 දින සිට ක්‍රියාත්මක කළ නිශ්චල දේපල පැවරීමේ දී ලියනු ලබන සියළුම සාධන පත්‍ර සඳහා පළාත් මුද්දර වෙනුවට මුද්දර වටිනාකමට සමාන බැංකු රිසිට්පත් ඇලවීම නියම කිරීමත් සමඟ එම රිසිට්පත් සමඟ නිකුත් කෙරෙන දේපල දීමනාකරු හා ලැබුම්කරු පිළිබඳ තොරතුරු පත මගින් තොරතුරු ලබා ගැනීම කඩිනම් විය.


ඔප්පු ලිවීමේදී නියමිත වටිනාකම් ඇතුළත් කර නිවැරදි මුද්දර ගාස්තු ගෙවීමට මහජනයා දැනුවත් කිරීමට නොතාරිස්වරුන්, බැංකු හා ණය දෙන මූල්‍ය ආයතන පෙළඹවීම සඳහා මධ්‍යම පළාත් මුදල් ප්‍රඥප්තියේ 67 වගන්තිය කෙරෙහි අවධානය යොමු කර එම පාර්ශව වෙත දැන්වීම් නිකුත් කිරීමට ද කටයුතු කරන ලදී. තවද, දෙපාර්තමේන්තුවේ ආදායම් වැඩි කර ගැනීමටත්, නොදැනුවත්කම මත සාධන පත්‍ර අඩු තක්සේරුවට ලියා පසුව දණ්ඩනද සමඟ අතිරේක මුද්දර ගාස්තු ගෙවීමට සිදුවීමෙන් මහජනතාව පත් වන අපහසුතාවය වළක්වා ගනු පිණිසත්, 2013-05-01 දින සිට ආරම්භ කරන ලද, දේපලක් හුවමාරුවීමට ප්‍රථම දෙපාර්තමේන්තුව වෙත පැමිණ අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ විට ගෙවිය යුතු මුද්දර ගාස්තු පිළිබඳ තක්සේරුකැගේ මතය ලබාදීමේ නව ක්‍රියා පිළිවෙළ මේ වන විට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන අතර, මේ නිසාවෙන් ඌන මුද්දර ගාස්තු සඳහා තක්සේරු දැන්වීම් නිකුත් කිරීම අඩු වූ අතර, ප්‍රභවයේදීම නියමිත බද්ද අයකර ගැනීමට හැකි විය. 2015 වර්ෂයේ දී මෙසේ නිකුත් කරන ලද තක්සේරු වාර්තා ගණන **854** කි.

2014 වසරේ ආදායම තුල අතිරේක මුද්දර ගාස්තු ලෙස අයකල රු. 81,942,257 ක් ඇතුලත් වන අතර 2015 වසරේ රැස් කරන ලද අතිරේක මුද්දර ගාස්තු ආදායම රු. 93,919,500 කි. එය පෙර වර්ෂයට සාපේක්ෂව 14.6% ක වර්ධනයකි. එයට හේතු වූයේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුළුල් දැක්මක් අනුව කටයුතු කිරීම බව

කිවයුතුයි. එමෙන්ම මාණ්ඩලික නිලධාරීන්ට ආදායම් ඉලක්ක ලබා දුන් අතර ඔවුන්ගේ එම ආදායම් ඉලක්ක වෙත ළඟා වීමේ ප්‍රගතිය මාසික වාර්තාවක් සේ ප්‍රධාන ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

| මුද්දර ගාස්තු ආදායම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ආදායම රු. | වර්ධනය % |
| 2009 | 907,000,000 | 374,752,586 | |
| 2010 | 440,000,000 | 481,400,739 | 28 |
| 2011 | 368,000,000 | 684,335,872 | 42 |
| 2012 | 725,000,000 | 827,681,905 | 21 |
| 2013 | 850,000,000 | 862,749,671 | 4 |
| 2014 | 875,000,000 | 1072,465,076 | 24 |
| **2015** | **880,000,000** | **1,342,990,172** | **25** |

| අතිරේක මුද්දර ගාස්තු ආදායම | |
|---|---|
| වර්ෂය | ආදායම රු. |
| 2009 | 2,592,691 |
| 2010 | 838,308 |
| 2011 | 16,527,044 |
| 2012 | 53,011,739 |
| 2013 | 71,011,329 |
| 2014 | 81,942,257 |
| **2015** | **93,919,500** |




**2. පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 4 ක් එකතු කිරීම**

පිරිවැටුම් බද්ද අහෝසි වීමත් සමඟ 2011 වර්ෂයට පෙර වර්ෂයන් සඳහා ගෙවිය යුතු හිඟව පවතින බදු ගෙවීමට බදු ගෙවන්නන්ගේ අනුකූලතාව ඉතා අඩු වූ අතර, එම බදු අයකර ගැනීමට ප්‍රඥප්තිය ප්‍රකාරව ගතහැකිව තිබූ සියළු ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව 2015 වර්ෂයේදී රු.6,184,356 ක මුදලක් එකතු කරන ලද අතර, ඒ වෙනුවෙන් ගොනු කරන ලද නව නීතිමය පියවර ගැනීම 37 ක්ද, ස්ථානයට ගොස් කරන ලද නීතිමය කටයුතුවල ට පෙර දැනුම් දෙනු ලබන නිවේදන භාර දීම් 38 ක් ද විය.

**3. බනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 3 ක් එකතු කිරීම**

මෙම බද්ද ආදාල ව්‍යාපාර ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන්ට අළුත් බද්දක් වීම , පොදුවේ බදු සම්බන්ධව අඩු දැනුම හා බදු සම්බන්ධව ඇති ආකල්ප හේතුවෙන් මෙම ඉලක්කය ළඟා කර ගැනීම සඳහා වැඩි වශයෙන් ක්ෂේත්‍ර සමීක්ෂණ , ස්ථාන පරීක්ෂණ හා දැනුවත් කිරීමේ කටයුතු කිරීමට සිදු විය.

**4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**

උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය ප්‍රඥප්තිය 2015 ජූනි මාසයේ දී ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු සම්මත කර ක්‍රියාත්මක කිරීම දක්වා විශාල කාර්යභාරයක් ඉටු කිරීමට සිදු විය. මුලු මධ්‍යම පළාතම ආවරණය වන පරිදි ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කිරීම, දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම, අවශ්‍ය ආකෘතිපත්‍ර සකස් කර ගැනීම, පරිගණක වැඩසටහන් සකස් කර ගැනීම ඒ අතර ප්‍රධානය.

**5. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.**

ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද 2014-04-01 සිට අයකිරිම සිදුවේ. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 2015 ඔක්තෝබර් මාසයේ දී සම්මත විය. පහත සඳහන් යෝජනා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර, මෙතෙක් අනුමත වී නොමැත.

1. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
2. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව

## 2015 ක්‍රියාකාරී සැලසුම අනුව කාර්ය සාධනය

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ළඟාකර ගැනීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය | **මුද්දර ගාස්තු ආදායම** | **රු.මිලි. 880** | **රු.මිලි. 1342.9** |
| | | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස් කිරීම | 33000 | 35951 |
| | | 3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරීම | 7000 | 7131 |
| | | 4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරීම | 7000 | 7131 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම.<br>6. ගොනු විශ්ලේෂණය කිරීම. (ආකෘති පත්‍ර 300,101 හා 226 මගින්) | 6500 | 8856 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | |
| | | 8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරීම. | | 3496 |
| | | ii. . මතය ලබා දීමේදී සහ ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම | රු.මිලි.65 | රු.මිලි.93 |
| | | 9. i තක්සේරු දැන්වීම් නිකුත් කිරීම 750<br>ii තක්සේරු මත නිකුත් කිරීම 1200 | 1950 | 1381 |
| | | 10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල) | | ඉටු කර ඇත |
| | | 11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | | 09 |
| | | 12. ආකෘති පත්‍ර නිකුත් කිරීම | | 20290 |
| | බනිජ අයිතීන් පළිබඳ බදු අංශය | බනිජ අයිතීන් පළිබඳ බදු ආදායම | **රු.මිලි. 3** | **රු.මිලි. 3.3** |
| | | 1. බනිජ බදු වාර්තා නිකුත් කිරීම | 4200 | 4100 |
| | | 2. වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරීම | 4200 | 418 |
| | | 3. ආකෘති පත්‍ර නිකුත් කිරීම | | 9435 |
| | | 4. ලිපිගොනු ආවේක්ෂණය කිරීම | 1000 | 1025 |
| | | 5. තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරීම | 50 | 5 |
| | | 6. බනිජ බදු ගෙවීම්පත් දත්ත පරිගණක ගත කිරීමට වැඩසටහනක් සකස්කර සියළුම ගෙවීම්පත් පරිගණකගත කිරීම. | සියල්ලම | ඉටු කර ඇත |

| | | | | |
|---|---|---|---|---|
| | අය හා හිඟ බදු අංශය | 1. හිඟ පිරිවැටුම් බදු අය කිරීම<br>2. අභියාචනා /විරෝධතා විසඳීම - ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම<br>3. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු එකතු කිරීම (D 7)<br>4. නොගෙවූ හා එකඟතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම.<br>5. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරීම<br>6.අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම<br>7. ආකෘති පත්‍ර නිකුත් කිරීම (BTT 901+SD1496) | **රු.මිලි. 4**<br>සියල්ලම<br>400<br>45<br>සියල්ලම | **රු.මිලි. 6.7**<br>ඉටු කර ඇත<br>383<br>46<br>ඉටු කර ඇත<br>ඉටු කර ඇත<br>2401 |
| 3. සියයට දහයට (10 %) වැඩි වාර්ෂික ආදායම් වර්ධන අනුපාතයක් පවත්වාගෙන යාම | 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සබ්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.<br>3. එම එක් එක් ආදායම් ප්‍රභවයන්ගෙන් උපයාගත හැකි ආදායම හඳුනා ගැනීම<br>4. ක්‍රියාත්මක කිරීමට වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම.<br>5. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනාවලිය ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 2015 ඔක්තෝබර් මස සම්මත විය. 2015 නොවැම්බර් සිට ක්‍රියාත්මක කරන ලදි.<br><u>ලැබූ ආදායම</u> :<br>ඇප තැන්පතු රු. මිලි. 13<br>ලි.ප.ගාස්තුව රු. 75,000<br>බල ගාස්තුව රු. 650,000 | |
| | කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම.<br>3. සම්පත් දායක පුද්ගලයන් සහ ආයතන හඳුනා ගැනීම.<br>4.පිරිවැය හඳුනා ගැනීම. | 2015 වසර තුළ පුහුණු සැසි 1ක් පවත්වා ඇත. | |
| | තොරතුරු තාක්‍ෂණයේ සංවර්ධනය | 1. කාර්යක්‍ෂම, ආරක්‍ෂාකාරී තොරතුරු පද්ධතියක් සැකසීම<br>2. කලින අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම | ජාලගත, ආරක්‍ෂිත පරිගණක පද්ධතියක් සකසා ඇත | |
| | තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීමක් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් එල කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4.වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | ඉටු කර ඇත | |
| යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | ඉටු කර ඇත | |

ඉහත සියලුම දත්තයන් ලබා ගන්නා ලද්දේ නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්‍ෂා කිරීමෙනි.

මීට අමතරව අපගේ ප්‍රගතිය වර්ධනය කර ගැනීම සඳහා මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ටාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරුදෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලීසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමා,ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ප්‍රධාන ලේකම්තුමා ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

2015 වසරේ දී මෙන්ම 2016 වර්ෂයේ දී ද අපගේ ක්‍රියාකාරී සැලැස්ම තුළින් ඉදිරිපත් කරනු ලබන ඉලක්ක අභිබවා යමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දීමට අපි ඇප කැප වෙමු.

**ස්තුතියි,**

(එච්. කේ. අජන්තා පෙරේරා)

පළාත් ආදායම් කොමසාරිස්

මධ්‍යම පළාත